# චූටිගේ අපූරු තෑග්ග



සෙනුති මල්ලවආරච්චි

# චූටිගේ අපූරු තෑග්ග

## සෙනුති මල්ලවආරච්චි

කතාව සහ චිත්‍ර

සෙනුති මල්ලවආරච්චි

ISBN 978-624-206-906-7

වෙනත් කෘති - මල් කුමාරියෝ

කෘතිය පළ කරන දිනය - 2023.11.15

# පිදුම

මගේ දෙමාපියන්ට

සහ

උදවු කල

සියලු දෙනාට

ආදරයෙන්

පුදමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශමිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

‘‘අම්මා... හෙට මගේ උපන් දිනය ද ?’’



‘‘ම්... ඉන්න මම කැලැන්ඩරයේ බලන්නම්.’’

‘‘ආ... ඔව් හෙට ඔයාගේ උපන් දිනය’’

‘‘ආ... කොච්චර හොඳයි ද ’’

‘‘ හෙට මම ඔයාට අපූරු තෑග්ගක් දෙනවා’’



‘‘මොකක් ද අම්මේ ඒ අපූරු තෑග්ග ?’’

‘‘මම ඒක හෙට කියන්නම්’’

‘‘ හා..හා... එහෙනම් හෙට කියන්න අම්මේ’’

‘‘ඔයා එතකන් අයියටයි, අක්කටයි කියන්න’’
‘‘හා මම අයියටයි, අක්කටයි කියන්නම්’’
‘‘අයියේ, අක්කේ, මෙහෙට එන්නකෝ....’’

ඇයි, ඇයි නංගි ?''

''හෙට මගේ උපන් දිනය''

''ආ.. කොච්චර හොඳයිද''



''අම්මා කිවුවා මට අපූරු තෑග්ගක් දෙනවා කියලා''

''මොකක්ද නංගි ඒ අපූරු තැග්ග''

''ඒ මොකක්ද කියලා අම්මා මට කීවේ නෑ...''

''චූටි දූ මට ගමනක් යන්න තියෙනවා.''

''අම්මේ මමත් එන්නද?'' ''නෑ චූටි දූ..''

''මම එනකොට ටිකක් හවස් වෙයි.''

''හා අම්මේ...'' ''මම අයියයි, අක්කයි, එක්ක ඉන්නම්.''

''මම එනකම් ඔයාලා පරිස්සමින් ඉන්න.



''අයියේ, අක්කේ අපි සෙල්ලම් කරමු.''

හා..හා.. නංගි අපි සෙල්ලම් කරමු.''



''නංගී... අම්මා එන්න පරක්කු වෙනව ද?''

''අක්කේ'... අම්මා එනකොට පරක්කු වෙනවා කියලා කිවුවා.''

# සවස් කාලය.....

''හා.. දැන් වෙලාව 5 යි. මම හිතන්නේ දැන් අම්මා එයි.''

''අර අම්මා නේද ?''

''අක්කා කියපු එක හරි.''



‘‘චූටි දූ මට මේ බඩු ටික අස් කරන්නු උදවු කරන්න පුළුවන්ද ?’’

‘‘හා, මට උදවු කරන්න පුළුවන්’’

‘‘අම්මේ, මම අස්කරලා ඉවරයි’’



''මට තවම තෑග්ග හම්බ වුණේ නෑ..''

''බලන්නකෝ හෙට උදේම චූටි දූට තෑග්ග ලැබෙයි.''



# පසු දින උදෑසන.....

චූටි දුව කුස්සියට දුවගෙන ඇවිත් වටපිට බැලුවා.

අම්මා රසම රස කිරිබත් හදනවා.



අයියයි අක්කයි ''සුභ උපන් දිනයක් වේවා'' කියලා සුභ පැතුවා



.''කෝ මගේ උපන්දින තෑග්ග ?'' චූටි ඇහුවා.
''හැමෝම තාත්තාගේ මුහුණ දිහා බැලුවා.

තාත්තා හිනා වෙලා ''මෙන්න චූටි දූගේ අපූරු තෑග්ග'' කියලා ලියුම් කවරයක් දුන්නා.



අක්කයි, අයියයි, චූටියි ලියුම හයියෙන් කියවන්න පටන් ගත්තා...



ඔබ මහාමායා බාලිකා විදුහලට
තේරී ඇති බව සතුටින් දැනුම් දෙමි.

බුදු සරණායි !

මෙයට,
විදුහල්පතිනිය.

නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

ISBN 978-624-206-906-7